සබ්බදානං ධම්මදානං ජිනාති.....

සැම දන් පරදවා ධර්ම දානය ජයගනී.............

*2061*

**ලුණු අටුව අත් පොත් 01**

# මහා පුරුෂ දේශනා

ගල්ගමුවේ සාසන සිරි ස්වාමීන් වහන්සේ

**ලුණු අටුව රජ ගල්ලෙන් ආරණ්‍යය**

ප්‍රථම මුද්‍රණය - ශ්‍රී බුද්ධවර්ෂ 2601

- ක්‍රිස්තු වර්ෂ 2012

සමාරාධනය

රම්මුතුගල බුද්ධවංස ස්වාමීන් වහන්සේ

පරිගණක අකුරු සැකසුම

ෂෙරීකා ඇන්

(ෂෙරීකා කොමියුනිකේෂන්, අංක 07, නාගරික පොදු වෙළඳසල, ගොංගාවෙළ, මාතලේ)

දු.අ. 077 - 4104665

ඊ -තැපැල dilrukanna@yahoo.com

sherikacom@gmail.com

මුද්‍රණය

ප්‍රියන්ත කේ. මැදගෙදර

ටෙක්නික් විෂන් ස්ටූඩියෝ සහ ස්ක්‍රීන් මුද්‍රණාලය

කවුඩැවල

දු.අ. 072 290 67 68 - 066 490 87 88

# ධර්ම දානයේ පරමාර්ථය

*ධර්ම ඥාණ*
*මාර්ග ඥාණ*
*ඵල ඥාණ*
*පිළිවෙළින්*
*නිවන් අවබෝධයෙන්*
*කෙලෙස් ගිනි නිවී*
*සංසාර විමුක්තිය පිණිස !*

# ආශිංසනය

දානයෙන් උතුම් දානය වන ධර්ම දානය සඳහා
නොමසුරුව තම දැහැමි ධනය පරිත්‍යාග කළ
සැමදෙනාගේ සම්‍යයක් සංකල්පනා මුදුන් පත් වේවා.
දැහැමි පැතුම් ඉටුවේවා.
පරම සත්‍ය අබබෝධ වේවා.
නිවන් මග වැටහේවා.
සියලු දුක්වලින් මිදේවා.
මරණයක් නැති අමා මහ නිවනින් සැනසීම ලබත්වා.

# ප්‍රස්තාවනාව

ලොව පහළ වී වදාළාවූ ද, මතු පහළ වන්නාවූ ද සියලු සම්මා සම්බුදු රජාණන් වහන්සේලා විසින් දේශනා කරන ශ්‍රේෂ්ඨ ගාථා රත්නයක අර්ථය මේ කුඩා ගතෙහි ඇතුළත් වේ. ''බුද්ධ ශාසනය යනු කුමක්ද?'' යන ප්‍රශ්නය ඇසූ විට බෞද්ධයෝ නොයෙක් ආකාර පිළිතුරු දෙති. ''බුදු සසුන'' ගැන නොදන්නවුන් විසින් බුදු සසුන ආරක්ෂාවීමක් වේද? නොවේමය. ''සසුන'' යනු පණිවිඩයයි. ඇසට නොපෙනෙන දෙවියන් වහන්සේගේ පණිවුඩය යැයි කියමින් අන්‍ය ලබ්ධිකයින් නොයෙක් මිත්‍යා අදහස් ලොව තුළ පතුරුවා හරින බව අපි දනිමු. ඒ පණිවිඩ හිස්මුදුනින් පිළිගත් මිත්‍යා මතධාරීහු ලොව බොහෝ ඇත්තාහ. ඒ තුළින් ඔවුහු දෙලොවින් ම පිරිහෙති. ඇත්තෙන්ම ඒ අදෘශ්‍යමාන සර්වබලධාරියෙකුගේ පණිවිඩ නොව මිනිසුන් අතර පරපුරෙන් පරපුරට පැමිණි අදහස්ම ය.

මිනිස් මව් කුසක ඉපදී, මිනිස් මවු කුසින් මිනිසෙකු නොහොත් රජ කුමරෙකුව බිහි වී, රජ සැප විඳ එහි ඇති නිස්සාර ස්වභාවය තේරුම් ගෙන, රජ සැප අලුයම හෙළු කෙළ පිඬක් සේ අතහැර වනගතව, එවකට භාරතයෙහි උසස් යෝගීන් යැයි සම්මත පිරිස් විමුක්තිය ලබන එකම ක්‍රමය යැයි

සැලකූ අත්ථකිලමථානුයෝගය පුරා එහිදු අර්ථයක් නැති බව දැන, මැදුම් පිළිවෙතින් මෙයින් වසර දෙදහස් හයසියයකට පමණ පෙර බෝධි මූලයේ දී ප්‍රඥාවේ කෙළවරට පැමිණීම නම් වූ සම්මා සම්බුද්ධත්වයට පත් ඒ ආශ්චර්යය මනුෂ්‍යයාණන් වහන්සේගේ පණිවිඩය හෙවත් සසුන අදත් එදා සේ පිරිසිදුව පවතී. කුමක් ද එම පණිවිඩය? සීල, සමාධි, ප්‍රඥා යන ත්‍රිශික්ෂා දියුණු කිරීමයි. මේ බුද්ධ අනුශාසනය හෙවත් බුද්ධ ශාසනය යි. මේ පණිවිඩය මනුෂ්‍යයන් අතර එදා බොහෝ දෙනෙකු අසා, පිළිගෙන එහි යෙදී සසරින් මිදුණු අතර අද මේ උතුම් පණිවිඩය අනුගමනය කිරීම තබා බුද්ධ ශාසනය කුමක්දැයි හරි හැටි දන්නෝ ද විරලයහ.

බුදු සසුන රැකිය යුත්තේ තමාම ය. සීල, සමාධි, ප්‍රඥා ගුණ තමා තුළ වැඩීමෙන් ය. නමුත් බොහෝ දෙනා බුදු සසුන රකිනවා යැයි කියා තම සිත තුළ තණ්හා, මාන, දිට්ඨි, ඊර්ෂ්‍යා, කුහකකම් ආදී අකුසල් සිතුවිලි වගාකොට, කුසලයෙන් බැහැර වී, තමා උසස් කොට සලකා අනුන් පහත් කොට ගෙන, මොහොතටවත් සිතෙහි එකඟකමක් අත් නොවිඳ, මිත්‍යා අදහස් වපුරමින් බුදු සසුන විනාශ කරති. මනුෂ්‍ය හද සන්තානයෙන් ගුණ දහම් පිරිහී ගියහොත් මෝහයේ වැලි තලාවෙන් බුදු සසුන සැඟවී යනු ඇත. මිනිස් ලොව අඳුරු වනු ඇත. බුදු සසුන යටපත් කිරීමේ පුරරෝගාමියෝ බෞද්ධයෝ

ය, හෙවත් මේ සසුන තුළ යෙදී ගුණ දම් පිරීමට ප්‍රතිඥා දී නමුත් එහි නොයෙදෙන ගිහි පැවිද්දෝ ය. බුදු සසුන අඳුරු කිරීමට අන්‍යාගමිකයන්ට නොහැකි ය. අප දේශයෙහි ඉතිහාසය සලකා බැලීමේ දී එය අවබෝධ කර ගැනීම අපහසු නොවේ. තුණුරුවන් ගුණ හඳුනාගත්, ශ්‍රද්ධාව ඇති වීර්යවත් පින්වතුන්ට මේ බුදු සසුනෙහි යෙදී ඒ තුළින් මොලොව ශාන්තිය, පරලොව සුගතිය, ශාන්ත නිවන යන මේ තිවර්ග සැපයෙන් සැනසෙනු හැකි ය.

මේ කුඩා දහම් ගතෙන් ''බුදු සසුන සහ එහි යෙදීම'' පිළිබඳව නිරවුල් අවබෝධයක් ඔබට ලැබේ. මෙපමණ කලක් හෝ බුදු සසුන ලක්දිව රැකුණේ අපේ අතීත භික්ෂූන් වහන්සේලා හා ආදී මුතුන් මිත්තෝ දිවි පරදුවට ගියත් ශීල, සමාධි, ප්‍රඥා තම සිත්වල රැකගත් හෙයිනි. මෙයින් අපට තේරුම් ගත හැකි කරුණක් වනුයේ මේ ග්‍රන්ථයෙහි සඳහන් වන පිරිදි බුදු සසුනෙහි නොයෙදූ වූ සිත බුදු සසුනෙහි අවසානය බවයි.

ග්‍රන්ථ කර්තෘ පූජනීය ස්වාමීන් වහන්සේ පාපය, කුසලය, නුවණ ගැන බුද්ධ වචනයට අනුවම කරුණු පැහැදිලි කර ඇත්තේ කාටත් වැටහෙන අයුරිනි. ගරු ස්වාමීන් වහන්සේගේ විවේක බුද්ධිය පන්හිඳ තුළින් දහම් ග්‍රන්ථකරණයට යෙදවීම ධර්මකාමී හැමගේ අමන්දානන්දයට හේතු වනු

නොඅනුමානය.

''සම්බුදු සසුන'' පිළිබඳ තම දිවි මඟෙහි මුල් යුගයේදී දැන, එම තරුණ කල බුදු සසුනෙහි උපරිම යෙදීමට හැකි පැවිදි - උපසම්පදාව ලබා අද මහා ථෙර බවට පත්ව ව්‍යක්ත, විශාරද, බහුශ්‍රැත, ධර්මධර, විනයධර, ධර්මානුධර්ම ප්‍රතිපන්න ශ්‍රමණ ගුණයන්හි පිහිටි සංයමීන් වහන්සේ නමක් ව මුඛ පරම්පරාවෙන් පැවත ආ ත්‍රිපිටක බුද්ධ වචනය ග්‍රන්ථාරූඪ කළ සිංහල මහ රහතන් වහන්සේලා රැස් වූ මාතලේ අලුලෙනට නුදුරුව රජගල්ලෙන වැඩ සිට නිහඬව සිදු කරන ධර්ම සේවයට අපගේ නමස්කාරය වේවා.

ගත් කතුවර පූජනීය ගල්ගමුවේ සාසනසිරි යතිවරයන් වහන්සේටද, මෙය මුද්‍රණය සඳහා කාලය, ශ්‍රමය, ධනය යෙදවූ සැමටද, මෙය කියවා බුදු සසුනෙහි අර්ථවත්ව යෙදීමට උත්සාහ ගන්නා සැමටද බුදු සසුනෙහි තවතවත් යෙදීමට ශක්තිය ලැබේවා !

**''චිරං තිට්ඨතු සාසනං''**

මෙයට
සසුන් ලැදි
රම්මුතුගල බුද්ධවංස ස්වාමීන් වහන්සේ

**නමො තසස භගවතො අරහතො**
**සමමා සමබුදධසස.**

සබ්බ පාපස්ස අකරණං ~ කුසලස්ස උප සම්පදා
සචිත්ත පරියෝදපනං ~ ඒතං බුද්ධානසාසනං

සියලු අකුසල් නොකිරීම ද, කුසලයට පැමිණීම ද, තම සිත පිරිසිදු කිරීම ද යන මේවා බුදුරජාණන් වහන්සේලාගේ අනුසාසනාවයි. හෙවත් පිළිපැදිය යුතු, අනුගමනය කළ යුතු බුදුරජාණන් වහන්සේලාගේ ධර්ම මාර්ගය යි.

එය සීල සාසනය, සමාධි සාසනය, ප්‍රඥා සාසනය කියා වේ. ශීලයෙන් පව්න් වැළකේ. සමාධියෙන් කුසලයට පැමිණේ. ප්‍රඥාවෙන් සිත පිරිසිදු වේ. පොදුවේ ගත් කළ ශීල, සමාධි, ප්‍රඥා යන තුනෙන් ලෝභ, ද්වේශ, මෝහ දුරු වේ. සියලු ලෝක සත්වයා විපතට හෙළන, දුකට ඇද දමන, නැවත නැවත පව් කරවන, පව් කරවා මෙලොවත් පරලොවත් දුක් ලබාදෙන, සතර අපායට යවන සසරේම බැඳ තබන, නිවනට යන්න නොදෙන ළාමක, නින්දිත ධර්මවලට කෙළෙස් යැයි කියනු ලැබේ. එම කෙළෙස් එක් දහස් පන්සියයක් බව ධර්මය තුළින් පෙන්වා ඇත. එම එක් දහස් පන්සියය ත්‍රස්තවාදී කල්ලියක් වාගේ. ලෝභ ද්වේශ මෝහ එම කල්ලියේ නායකයෝ වාගේ ය. සත්වයා ගස නම්

ලෝභ ද්වේශ මෝහ එහි ප්‍රධාන අතු තුනයි. ඉතිරි කෙළෙස් කුඩා අතු රිකිලි වාගේ. ප්‍රධාන අතු තුන කපා දැමීමෙන් සියලු කුඩා අතු විනාශ වේ. කඳ පමණක් ඉතිරි වේ.

එමෙන් ම ලෝභ ද්වේශ මෝහ තුන දුරු වීමෙන් අනෙක් සියලු කෙළෙස් දුරු වේ. තවත් ක්‍රමයකට කියනවා නම් ශීලයෙන් ද්වේශයත්, සමාධියෙන් ලෝභයත් දුරු වේ. ප්‍රඥාවෙන් මෝහයත් දුරු වේ. මොන හේතුවක් නිසා හෝ සතෙකුගේ ජීවිතෙන් ප්‍රාණය තොර කළොත් හෙවත් මැරුවොත් එය කරන්නේ ම ද්වේශයෙන්. නමුත් ඊට පෙර මස් රසට හෝ මුදල් ඉපයීමට ලෝභය ඇති වේ. සතුන් මැරීම පවක්, වරදක් බව නොදැනීම නම් වූ මෝහය ඇති වේ. එහෙත් සත්වයා කෙරෙහි කරුණාවක් මෛත්‍රියක් තිබුණොත් කිසි විටෙක මැරිය නොහැක.

අනුන් කෙරෙහි මෛත්‍රියක් ඇත් නම් කිසිවෙකුට සොරකමක් කළ නොහැක. ඒ නිසා ද්වේශයෙන් සොරකම සිදු වේ. එහෙත් වස්තුවට ආශාව ඇතිවීම ලෝභය යි. එය හොරෙන් ගැනීම වරදක් බව නොවැටහීම මෝහය යි.

අනුන් සතු බිරියක් සමඟ වැරදි ලෙස හැසිරීම නිසා සැමියා සතුටු වෙන්නේ නැහැ. පර පුරුෂයන්

සමඟ වැරදි ලෙස හැසිරීම නිසා ඔහුගේ බිරිඳ සතුටු වන්නේ නැහැ. එසේ නම් ඒ අය කෙරෙහි මෛත්‍රිය ඇති අයෙකුට කිසිවිට පරදාර, පර පුරුෂ සේවනයක යෙදෙන්න බැහැ. මෛත්‍රිය නම් අනුන් සුවපත් වනවාට ඇති කැමැත්ත යි. නමුත් පරදාර, පර පුරුෂ සේවනය නිසා තම බිරිඳ වරදෙහි යෙදීම නිසා සැමියාත්, තම සැමියා වරදෙහි බැඳීම නිසා බිරිඳත් නොසතුටු වීම ඔවුන්ට සැපයක් නොවේ. දුකක්. එසේ දැන දැන යමෙක් එය කරන්නේ නම්, ද්‍රෝහි කමකි. ද්‍රෝහිකම යනු ද්වේශ කිරීමයි. එහෙත් කාම සැපයට ඇලුම් කිරීම ලෝභය යි. එය වරදක් බව නොදැනීම හෝ එහි විපාක නොදැනම මෝහය යි.

බොරු කීම ද කිසිදා මෛත්‍රියෙන් කළ නොහැක. අනුන් රැවටීම ඔවුන්ට කරන හොඳක් නොවේ නරකකි. එසේ නම් නරක දෙයක්, අයහපතක් කළ හැක්කේ ද්වේශයෙනි. එහෙත් යමක් ලබා ගැනීම හෝ තමා සතුදේට ඇති ලෝභය නිසා බොරු කීමට පෙළඹේ. එහි ආදීනව නොදැනීම මෝහය යි.

මත් වතුර බීම නිසා තමාගෙන් අනුන්ට වන පීඩාව, හිරිහැරය දැන අනුන්ට, තම මව්පියන්ට, දරුවන්ට බිරිඳට මෛත්‍රියක් ඇති කෙනෙකුට මත් වතුර බීමට නොහැක. එසේ කරන්නේ නම් ඔහු

මෛත්‍රිය නැත්තෙකි. මෛත්‍රිය නැතිව පව් කෙරේ නම් එය ද්වේශයෙන් කරන දෙයකි. එහෙත් එයට ඇති ආශාව ලෝභය යි. ආදීනව නොදැනීම මෝහය යි.

මේ පස් පව ම කිරීමෙන් ජනිත අකුසල කර්මයෙන් තමන්ට ලැබෙන්නේ ම අපා දුක් ඇතුළු දුක් විපාක යි. තමාට තමාම වුණත් දුක් ඇති කර ගන්නවා නම් ඔහු තමාටම මෛත්‍රිය නැත්තෙකි. තමාට හෝ අනුන්ට සැප කැමති වීම මෛත්‍රිය මෙන් ම තමාට හෝ අනුන්ට දුක් කැමතිවීම ද්වේශය යි.

මේ පස් පව ''වේර ධර්ම'' හැටියට දේශනා කර ඇත. ''පඤ්ච වේරානි''. වේර නම් වෛරය යි. වෛරය නම් ද්වේශයේ ම දරුණු අවස්ථාව යි. ඒ පහ වේර ධර්ම වශයෙන් වදාළේ ඒ පහම ද්වේශය ඇතිවීමට හේතු වන නිසා. පස් පවින් වැළකීම ශීලය යි. එබැවින් ශීලයෙන් ද්වේශය දුරු වේ.

පළවෙනි ධ්‍යානය පෙන්වන තැන පළමුවෙන් ම පෙන්වන්නේ ''විවිච්චේව කාමේහි'' යනුවෙනි. කාමයෙන් වෙන්ව ඊට පසුවයි ''විවිච්ච අකුසලේහි ධම්මේහි'' යනුවෙන් වදාළේ. අකුසල ධර්මයන්ගෙන් වෙන්ව යනු ද්වේශ ඇතුළු අකුසල ධර්ම, කාමච්ඡන්ද නම් වූ ලෝභය සමාධියට විරුද්ධ අකුසල ධර්මයකි. ද්වේශය ඇතිවෙන්නේම ලෝභය නිසයි. ලෝභය නැති නම් ද්වේශයකුත් නැත. ඒ නිසයි අනාගාමී

මාර්ගයෙන් කාම රාග නම් වූ, කාමාශාව නම් වූ ලෝභය සමඟ පටිඝ නම් වූ ද්වේශය දුරු වෙන්නේ.

සැමියා බිරිඳගෙන් බිරිඳ සැමියාගෙන්, දරුවෝ මව්පියන්ගෙන් මව්පියෝ දරුවන්ගෙන්, වෙනත් යම් යම් අය වෙනත් අයගෙන් යමක් බලාපොරොත්තු වෙනවා. එසේ බලාපොරොත්තු වීම ලෝභය නම්, ඒ කැමති වන දෙය, බලාපොරොත්තු වන දෙය ඉටුනොවීමෙන් ඇති වන්නේම නොසතුට යි. අමනාපයයි. එය ද්වේශයයි. එය සියුම් ලෙසිනුත්, ප්‍රකට ලෙසිනුත් වෙනවා. මේ අනුව ආශාවන් සිතේ තිබෙන තුරු සමාධිය ලැබෙන්නේ නැහැ. ආශාවලින් පිරුණු කෙනාගේ සිත නිතරම නොසන්සුන්. සිත් සංසුන් වන්නේ ආශාවන් යටපත්වීමෙන්ය. සමාධියෙන් ලෝභය දුරු වෙනවා කීවේ ඒ නිසයි.

මෝහයයි, ප්‍රඥාවයි දෙක ආලෝකයයි අඳුරයි වගේ. ආලෝකය ඇතිවීමෙන් ම අඳුර දුරු වෙනවා වාගේ ප්‍රඥාවෙන් මෝහය දුරු වෙනවා.

පාප යනු මොනවාද? ආශාව, තරහ, මුලාව හෙවත් නොදැනීම, මාන්නය, ඉරිසියාව, මසුරුකම, ගුණයට නොනැමීම, ලැජ්ජා නැතිකම, වැරදි කිරීමට බය නැති කම, නොසන්සුන්කම, පසුතැවිල්ල, කම්මැලිකම, සැකය, වෛර කිරීම, පළි ගැනීම, එකට එක කිරීම, ගුණ කිව යුතු අයගේ අගුණ කීම,

අගුණ කිව යුතු අයගේ ගුණ කීම, තම වරද නොදැකීම, අනුන් පෙන්වා දුන් විට වරද පිළි නොගැනීම, කළ වරදට සමාව නොගැනීම, ගරු කළ යුත්තන්ට ගරු නොකිරීම, ගරු කළ යුතු අයගේ කීම පිළි නොගැනීම, කළ යුතු හොඳ දේ වන දාන ශීල භාවනාදිය නොකිරීම, කරන්න එපා යැයි කියන වැරදි දේ කිරීම, කපටිකම, වංචාව, ධර්මයට අකමැති බව, අධර්මයට කැමති බව, බාල දේ වටිනා දේ හැටියට පෙන්වීම, විකිණීම, සතුන් මැරීම, මැරවීමට අනුබල දීම, මරණවාට කැමතිවීම, සොරකම් කිරීම, කරවීම, අනුබල දී එයට කැමති වීම, දුරාචාරය, මත් වතුර, මත් කුඩු, මත් ගුලි, මත් දුම් ආදිය ගැනීම, බොරුව, කේළම, පරුෂ වචන කීම, හිස් වචන කීම, අනුන් සතු දේට ආශා කිරීම, මිත්‍යා හෙවත් වැරදි ලෙස දැකීම, වෛර කිරීම යන සියල්ල කිරීම, කරවීම, අනුබල දීම, ඒවාට කැමතිවීම, ඒවා අනුමෝදන් වීම. මවුපියන්ට නොසැලකීම.

කැපීම්, කෙටීම්, ගැසීම්, බැනීම්, රැවීම්, ගෙරවීම්, බලහත්කාරකම් කිරීම් මේ ආදී යම් දෙයක් තමන්ට හෝ අනුන්ට හෝ මෙලොවට හෝ පර ලොවට හෝ අවැඩ පිණිස, අහිත පිණිස, දුක් පිණිස වේ නම් ඒ සියල්ල පව් ය. කොටින් කියතොත් තමන්ට හෝ අනුන්ට හෝ මෙලොවට හොඳ පර ලොවට හොඳ වුණත්, කියන කරන සිතන යම් දෙයක්

ලෝභයෙන් යුක්ත නම් ද්වේශයෙන් යුක්ත නම් මෝහයෙන් යුක්ත නම් ඒ සියල්ල පාප ධර්මයි.

පරමාර්ථ වශයෙන් ලෝභය මුල්ව ඇති වෙන සිත් අට, ද්වේශය මුල් ව ඇතිවෙන සිත් දෙක, මෝහය මුල් ව ඇති වෙන සිත් දෙක යන සිත් දොළහ සමඟ එක්ව යෙදෙන සිතුවිලි දාහතර සහ කුසල් සිත්වලත් යෙදෙන ඇතැම් සිතුවිලි අකුසල් වෙනවා.

ඉහතින් දක්වා ඇත්තාවූ ද, වැරදි යැයි සම්මත දේ, ලෝභ ද්වේශ මෝහ මුල්ව සිත කය වචනයෙන් සිදු කරනවිට මෙම අකුසල් සිත් දොළහ එක් පුද්ගලයෙකුගේ සන්තානය තුළ ඇතිවෙන වාර ගණන මෙතෙකැයි කියා ගණනින් දැක්විය නොහැක.

එනිසාම අප්‍රමාණ සත්වයෝ නැවත නැවතත් අපායවලම උපදී. මිනිස් ලොව උපන්නත්, අල්පායුෂ ඇතිව, දුර්වර්ණව, අල්පේශාඛ්‍යව, දිළිඳුව, අඩු කුලවල, නුවණ මදිව, මන්ද බුද්ධිකව, අංගවිකලව ඉපදී, පවටම බර වී, ධර්මයට ද්වේශ කරමින්, අධර්මයෙන් කටයුතු කරමින් අප්‍රමාණ දුක් විඳින නිසා ඒ දුක්වලින් සත්වයන් මිදවීමේ මහා කරුණාවෙන් ම සියලුම පව් නොකරන ලෙස බුදු රජාණන් වහන්සේලා අනුශාසනා කරන සේක.

සියලු පව් නොකිරීම. සම්මා සම්බුදුබව, පසේ

බුදුබව, ශ්‍රාවක බුදුබව ලබන පිළිවෙත නිසා සියලුම බුදුරජාණන් වහන්සේලා අනුගමනය කළ, ගමන් කළ, දේශනා කළ ධර්ම මාර්ගය යි.

## කුසලස්ස උපසම්පදා

කුසලයට පැමිණීම. කුසලයට පැමිණෙන්නේ කොහොමද?

බුදුරජාණන් වහන්සේ විසින් මහණෙනි, අග්‍ර යැයි දැනගත යුතු දීර්ඝ කාලයක් සිට පවතින බුදු පසේ බුදු මහ රහතුන් වහන්සේලාගේ වංශයෙන් පැවත එන්නා වූ නුවණැති කිසිවෙකු ඉවත නොදැම්මා වූ දැන් ද බැහැර නොකරන අනාගතයේත් බැහැර නොකරන්නා වූත් මහා දාන පහක් තිබෙනවා යැයි හඳුන්වා දුන් සේක.

යමෙක් සතුන් මැරීමෙන්, සොරකමෙන්, දුරාචාරයෙන්, බොරුවෙන්, මත් වතුර බීමෙන් වැළකුණෝ නම් ඔහු අප්‍රමාණ සත්වයන්ට අභය දෙන්නෙක් වෙනවා. අවෛරය දෙන්නෙක් වෙනවා. නිදුක් බව දෙන්නෙක් වෙනවා. අප්‍රමාණ සත්වයන්ට අභය දීලා, අවෛරය දීලා, නිදුක් බව දීලා, අප්‍රමාණ වූ අවෛරය හෙවත් මෛත්‍රියට, අප්‍රමාණ අභයට, අප්‍රමාණ නිදුක් බවට කොටස්කාරයෙක් වෙනවා.

මෙසේ සතුන් මැරීමෙන් වැළකීම පවු නොකිරීම යි. එය ම අභය දී අවෛරය දී නිදුක් බව දී අප්‍රමාණ නිර්භය භාවයට, අප්‍රමාණ මෛත්‍රියට, අප්‍රමාණ නිදුක් බව වූ සැපයට කොටස්කරුවෙක් වීම කුසලයට පැමිණීමයි.

මේ විදියට සොරකමෙන්, දුරාචාරයෙන්, බොරුවෙන්, මත් වතුර බීමෙන් වැළකීම පව් නොකිරීම යි. එයින් ම අප්‍රමාණ සත්වයන්ට අභය, අවෛරය, නිදුක් බව දීම කුසලයක් වන බැවින් එහි විපාක වශයෙක් අප්‍රමාණ අභය, අවෛරය, නිදුක් බව ලැබීම කුසලයට පැමිණීමයි.

මේ අයුරින් ම ලෝභ නොකිරීම පව් නොකිරීම යි. ත්‍යාගවන්තවීම කුසලයට පැමිණීම යි. ද්වේශ, වෛර, ක්‍රෝධ, පළිගැනීම, එකට එක කිරීම ආදිය නොකිරීම පව් නොකිරීම යි. එයින් ම මෛත්‍රී සිත් ඇතිවීම කුසලයට පැමිණීම යි.

මුලා නොවීම, නොරැවටීම, මෝඩකම් නොකිරීම පව් නොකිරීම යි. එයින් ම නුවණ වැඩීම, මෝඩකම් නොකරන්නේ ප්‍රඥාව නිසා, නුවණැති නිසා, එබැවින් ප්‍රඥාව හෙවත් නුවණ කුසලයක් බැවින් කුසලයට පැමැණීම යි.

වැරදි අදහස් නොගැනීම පව් නොකිරීම යි.

එයින් ම නිවැරදි අදහස් ඇති වීම කුසලයට පැමිණීමයි. මාන්නය ඇති කර නොගැනීම පව් නොකිරීම යි. එයම නිහතමානීකම බැවින් කුසලයට පැමිණීම යි. ඉරිසියා නොකිරීම පව් නොකිරීමයි. ඉරිසියා නොකිරීම මුදිතාව ඇතිවීම යි. ඉරිසියාව නම් අනුන්ගේ සැප දියුණුව, උගත්කම, වර්ණවත් බව, කුලවත් බව, ධනවත් බව නොඉවසීම යි.

අනුන්ගේ දියුණුව, සැප, උගත්කම, වර්ණවත් බව, කුලවත් බව, ධනවත් බව දැක සතුටුවීම මුදිතාවයි. එයින් ම කුසලයට පැමිණීම යි.

වංචා නොකිරීම පව් නොකිරීම යි. අවංකකම කුසලයට පැමිණීම යි. බැනීම පාපය යි. නොබැනීම, පව් නොකිරීම කුසලයට පැමිණීම යි. ගැසීම, කැපීම, කෙටීම පාපය යි. ඒවා නොකිරීම පව් නොකිරීම මෙන් කුසලයට පැමිණීම යි. මව්පියන් ට නොසැලකීම පාපය යි. සැලකීම පව් නොකිරීම මෙන් ම කුසලයට පැමිණීම යි. පව් නොකිරීමත් කුසලයට පැමිණීමත් මේ අයුරින් ද කළ හැකි ය.

01. අනෙක් අය සතුන්ට හිංසා කරන්නෝ ය.
    අපි හිංසා නොකරන්නෝ වෙමු.
02. අනෙක් අය සතුන් මරන්නෝ ය.
    අපි සතුන් නොමරන්නෝ වෙමු.

03. අනෙක් අය අබ්‍රහ්මචාරීහු ය.
එහෙත් අපි බ්‍රහ්මචාරීහු වෙමු.

04. අනෙක් අය සොරකම් කරන්නෝ ය.
අපි සොරකම් නොකරන්නෝ වෙමු.

05. අනෙක් අය බොරු කියන්නෝ ය.
එහෙත් අපි බොරු නොකියන්නෝ වෙමු.

06. අනෙක් අය කේළාම් කියන්නෝ ය.
අපි කේළාම් නොකියන්නෝ වෙමු.

07. අනෙක් අය පරුෂ වචන කියන්නෝ ය.
අපි පරුෂ වචන නොකියන්නෝ වෙමු.

08. අනෙක් අය හිස් වචන කියන්නෝ ය.
අපි හිස් වචන නොකියන්නෝ වෙමු.

09. අනෙක් අය දැඩි ලෝභ ඇත්තෝ ය.
අපි දැඩි ලෝභ නැත්තෝ වෙමු.

10. අන්‍යයෝ මිත්‍යා දිෂ්ඨිකයෝ ය.
අපි මිත්‍යා දිෂ්ඨිකයෝ නොවෙමු.

11. අන්‍යයෝ වෛර කරන්නෝ ය.
අපි වෛර නොකරන්නෝ වෙමු.

12. අනෙක් අය වැරදි ලෙස සිතන්නෝ ය.
අපි නිවැරදිව සිතන්නෝ වෙමු.

13. අනෙක් අය වැරදි වචන කතා කරන්නෝ ය.
අපි වැරදි වචන කතා නොකරන්නෝ වෙමු.

14. අනෙක් අය වැරදි වැඩ කරන්නෝ ය.
අපි වැරදි වැඩ නොකරන්නෝ වෙමු.

15. අනෙක් අය වැරදි ලෙස ජීවත් වන්නෝ ය.
අපි නිවැරදිව ජීවත් වන්නෝ වෙමු.

16. අනෙක් අය වැරදි දෙයට උත්සාහ කරන්නෝ ය.
අපි නිවැරදි දෙයට උත්සාහ කරන්නෝ වෙමු.
17. අනෙක් අය වැරදි සිහිය ඇත්තෝ ය.
අපි නිවැරදි සිහිය ඇත්තෝ වෙමු.
18. අනෙක් අය වැරදි සමාධිය ඇත්තෝ ය.
අපි නිවැරදි සමාධිය ඇත්තෝ වෙමු.
19. අනෙක් අය වැරදි ඥාණ ඇත්තෝ ය.
අපි නිවැරදි ඥාණ ඇත්තෝ වෙමු.
20. අන්‍යයෝ වැරදි විමුක්ති (මිදුන) ඇත්තෝ ය.
අපි නිවැරදිව මිදුන ඇත්තෝ වෙමු.
21. අන්‍යයෝ හැකුළුණ සිත් ඇත්තෝ ය.
අපි ප්‍රබෝධමත් සිත් ඇත්තෝ වෙමු.
22. අන්‍යයෝ නොසංසුන් සිත් ඇත්තෝ ය.
අපි සන්සිඳුණ සිත් ඇත්තෝ වෙමු.
23. අන්‍යයෝ සැක ඇත්තෝ ය.
අපි සැක නැත්තෝ වෙමු.
24. අන්‍යයෝ නිතර කිපෙන්නෝ ය.
අපි නිතර කිපෙන්නෝ නොවෙමු.
25. අන්‍යයෝ වෛර බඳින්නෝ ය.
අපි වෛර නොබඳින්නෝ වෙමු.
26. අන්‍යයෝ ගුණ මකුවෝ ය.
අපි ගුණමකු නොවූවෝ වෙමු.
27. අන්‍යයෝ එකට එක කරන්නෝ ය.
අපි එකට එක නොකරන්නෝ වෙමු.
28. අන්‍යයෝ ඉරිසියා කරන්නෝ ය.
අපි ඉරිසියා නොකරන්නෝ වෙමු.

29. අන්‍යයෝ මසුරෝ ය.
අපි මසුරු නොවන්නෝ වෙමු.
30. අන්‍යයෝ කපටියෝ ය. අපි කපටියෝ නොවෙමු.
31. අන්‍යයෝ නැති ගුණ පෙන්වන්නෝ ය.
අපි නැති ගුණ පෙන්වන්නෝ නොවෙමු.
32. අන්‍යයෝ දරදැඬු සිත් ඇත්තෝ ය.
අපි දරදැඬු සිත් නැත්තෝ වෙමු.
33. අන්‍යයෝ අධික මානය ඇත්තෝ ය.
අපි අධික මානය නැත්තෝ වෙමු.
34. අන්‍යයෝ කියන දේ නොඅසන දුර්වචයෝ ය.
අපි කියන දේ අහන සුවචයෝ වෙමු.
35. අන්‍යයෝ පාප මිතුරන් ඇත්තෝ ය.
අපි කළ්‍යාණ මිතුරන් ඇත්තෝ වෙමු.
36. අන්‍යයෝ ප්‍රමාද වූ සිහිය ඇත්තෝ ය.
අපි අප්‍රමාද වූ සිහි ඇත්තෝ වෙමු.
37. අන්‍යයෝ ශ්‍රද්ධාව නැත්තෝ ය.
අපි ශ්‍රද්ධාව ඇත්තෝ වෙමු.
38. අන්‍යයෝ පවට ලැජ්ජා නැත්තෝ ය.
අපි පවට ලැජ්ජා ඇත්තෝ වෙමු.
39. අන්‍යයෝ පවට බය නැත්තෝ ය.
අපි පවට බය ඇත්තෝ වෙමු.
40. අන්‍යයෝ ධර්මය නොදන්නෝ ය.
අපි දහම් දැනුම ඇත්තෝ වෙමු.
41. අන්‍යයෝ කම්මැලියෝ ය.
අපි වීරිය වන්තයෝ වෙමු.

42. අන්‍යයෝ සිහි මුළා වූ සිහිය නැත්තෝ ය.
අපි සිහියෙන් කටයුතු කරන්නෝ වෙමු.
43. අන්‍යයෝ මෝඩයෝ ය. අපි නුවණැත්තෝ වෙමු.
44. අන්‍යයෝ තමන් හරි යැයි සිතා ගත් දේ දැඩිව අල්ලා ගෙන ඉන්නෝ ය.
අපි එසේ නොවන්නෝ වෙමු.

මෙම කරුණු සල්ලේඛ සූත්‍රය ඇසුරිනි. සල්ලේඛ ප්‍රතිපදාව යනු කෙළෙස් ඉවත් කරන පිළිවෙතයි. මේ කරුණු 44 තුළ මුළු බුද්ධ සාසනය ම තිබෙනවා කීවොත් නිවැරදි ය. විහිංසාදී කරුණු 44 ම පාප ධර්ම යි. අනෙක් අය මේ පාප ධර්මවලින් යුක්ත යැයි ඒ අය පහත් කිරීම හෝ නින්දා කිරීම හෝ ඒ අය වර්ජනය කිරීම නොව කළ යුත්තේ ඒ අය තුළ තිබෙන පාප ධර්ම හොඳට පේන නිසා තමා තුළත් මේ පාප ධර්ම ඇති බව වටහාගෙන පාප ධර්ම ඇති පුද්ගලයෝ නොවෙයි බැහැර කළ යුත්තේ තමා තුළ ඇති පාප ධර්ම යි. බොහෝ දුරට තමාගේ වැරදි නොපෙනී අනුන්ගේ වැරදි පෙනීම ස්වභාවයක්. ඥානවන්තයා අනුන්ගේ වැරදි දකින විට තමා තුළ ඒවා ඇත් දැයි බලා ඒවා බැහැර කරනවා.

එසේ කිරීම ''සබ්බ පාපස්ස අකරණං'' වෙනවා. අවිහිංසාදි කරුණු 44 තමා තුළ උපදවා ගැනීම කුසලයට පැමිණීම යි. ''කුසලස්ස උපසම්පදා'' නම් වෙනවා. විහිංසාදි කරුණු 44න් ම

සිත අපිරිසිදු වෙනවා. ඒවා බැහැර කර අවිහිංසාදී කරුණු 44 තමා තුළ උපදවා ගැනීමෙන් තම සිත පිරිසිදු වෙනවා. ''සචිත්ත පරියෝදපනං'' යැයි වදාළේ එය යි.

විහිංසාදි කරුණු 44 ම නැති වෙනවා. ඒ අනිත්‍යතාවය යි. ඒවා නිසා සත්වයෝ පීඩාවට පත් වෙනවා. එය දුක්ඛ ලක්ෂණය යි. ඒවායේ කිසි සාරයක් නැති බව අනාත්ම යි. විහිංසාදිය නිසා දුකට පත් වීම දුක්ඛ සත්‍යය යි. ඒ විහිංසාවාදී සියල්ලම දුක් උපදවන නිසා සමුදය සත්‍යය යි. විහිංසාදිය දුරු කරන උපාය මාර්ග ආර්ය සත්‍යය යි. විහිංසාදිය දුරු කිරීම නිරෝධ සත්‍යය යි.

මෙසේ යම් දෙයක් වැරදි නම් එය පාපය යි. එය දුරු කිරීම කුසලයට පැමිණීමයි. සිත අපිරිසිදු වෙන්නේ පාපයෙන්. පව් දුරු කිරීම ම සිත පිරිසිදු කිරීමයි. 'සචිත්ත පරියෝදපනං'' සිත පිරිසිදු කරන තවත් ක්‍රම, කල්ක හෝ සබන් හෝ ෂැම්පූ ආදිය යොදා වතුරින් තෙමා දෙඅතේ ඇඟිලිවලින් පිරි මැද සෝදා හිස පිරිසිදු කරනවා වාගේ අරහං ආදී බුදු ගුණ සිහි කිරීමෙන් කෙළෙස් යටපත්ව සිත පිරිසිදු වේ. සබන් ගා අතුල්ලා වතුරෙන් සෝදා ඇඟ පිරිසිදු කරනවා වාගේ ධර්ම සජ්ඣායනය මෙනෙහි කිරීම, ධර්ම සාකච්ඡා මෙන් ම ධම්මානුස්සති භාවනාවෙන් සිත පිරිසිදු වේ.

සබන්, රින්සෝ, පෙනල ගෙඩි යොදා අපුල්ලා රෙදි සේදීමෙන් පිරිසිදු වෙනවා වාගේ සංඝ රත්නයේ ගුණ සිහි කිරීම සුපටිපණ්ණෝ පාඨය සජ්ඣායනය හා මෙනෙහි කිරීමෙන් සිත පිරිසිදු වේ.

දූවිලි බැඳුන කැඩපත සෝදා පිරිසිදු කරනවා වාගේ ශීලයේ පිහිටා ශීලය සිහි කරමින් ශීලානුස්සති භාවනා කිරීමෙන් සිත පිරිසිදු වේ. උඳුනේ දමා රත්කර තලා ලුණු කාරම් ජලයේ දමා රන් රිදීවල මළ ඉවත් කරනවා වාගේ පරිත්‍යාග කර කර නැවත නැවත එය සිහි කිරීම් වශයෙන් ත්‍යාගානුස්සති භාවනාවෙන් සිත පිරිසිදු වේ.

සිත අපිරිසිදු වන්නේ ම කෙළෙස්වලින් පව් කරන්නේ ත් කෙළෙසුණ සිතිනි. සිත, කය, වචනයෙන් පව් නොකිරීම හා දානය ශීලය භාවනාව පින් දීම පින් අනුමෝදන් වීම ධර්ම දේශනා කිරීම ධර්මය ඇසීම සිල්වත් ගුණවත් වැඩිහිටි අයට ගරු කිරීම, වත් පිළිවෙත් කිරීම, වෙනත් පිංකම්වල යෙදීම කුසලයට පැමිණීම මෙන් ම සිත පිරිසුදු වීමද වේ.

පරමාර්ථ වශයෙන් කාමාවචර කුසල් සිත් අට රූපාවචර කුසල් සිත් පහ අරූපාවචර කුසල් හතර හා කුසල පාක්ෂික සිතුවිලි 38 ඉපදවීම කුසලයට පැමිණීමයි.

කාමාවචර කුසල් සිත් ඉපදවීමෙන් ඒ මොහොතට පමණක් සිත් පිරිසිදු වේ. රූපාවචර අරූපාවචර සිත් ඉපදවීමෙන් තාවකාලිකව කාලයකට සිත් පිරිසිදු වේ. ලෝකෝත්තර මාර්ගඵල සිත් අට සහ ඒ සමඟ යෙදෙන සිතුවිලි ඉපදවීම ස්ථිරව කිසිදා නැවත නොකෙළෙසෙන පරිදි සිත පිරිසිදු වේ.

පව්න් වැළකී කුසල් කරමින් සමථ විදර්ශනා භාවනාවල යෙදෙමින් ක්‍රමක්‍රමයෙන් ටිකෙන් ටික කෙළෙස් කුණු ඉවත්වෙවී ගොස් සෝතාපන්න, සකෘදාගාමී, අනාගාමී, අරිහත් බව ලැබීමෙන් ඉතා සුපරිසුද්ධ සිත් ඇති කරගෙන එයින් ම ජීවිතය ආලෝකමත් කරගෙන සියලුම දුක්වලින් මිදීම ''ඒතං බුද්ධාන සාසනං'' බුදු පසේ බුදු ශ්‍රාවක බුදු උතුමන්ගේ ප්‍රතිපදා මාර්ගය යි. පිළිවෙත යි.

කරණීයමත්ථ සූත්‍රයෙහි අකරණීය ධර්මයන්ගෙන් වැළකීම පවු නොකිරීමයි. කරණීය ධර්ම සිදු කිරීම කුසලයට පැමිණීමයි. එම දෙආකාරයෙන් ම තාවකාලිකව සිත පිරිසිදු වී මෛත්‍රී භාවනාවෙන් මාර්ගඵල ලැබීමෙන් ස්ථිරව සිත පිරිසිදු වේ.

මහා මංගල සූත්‍රයෙන් සෑම පාපයකටම හේතු වෙන අනුවණ, අසත් පුරුෂ බාලයන් ඇසුරු

නොකිරීමෙන්, පව්න් වැළැකීමත්, ඉතිරි මංගල කරුණුවලින් කුසලයට පැමිණ රහත්වීමෙන් සිත පිරිසිදු වීම වදාළ සේක.

සිඟාලෝවාද, ව්‍යග්ඝපජ්ජ ආදී සෑම සූත්‍ර දේශනාවන්ගෙන් ම මේ ක්‍රමය දේශනා කර ඇති අතර විනය පිටකය පිළිපැදීමෙන් පව් නොකිරීමත් සූත්‍ර පිටකයට අනුව පිළිපැදීමෙන් කුසලයට පැමිණ අභිධර්මයෙන් සිත පිරිසිදු කිරීම එක් ක්‍රමයකට පෙන්වා දිය හැකි අතර, මුළු ත්‍රිපිටක ධර්මයම පව්න් වැළැකී කුසලයට පැමිණ සිත පිරිසිදු කරන ප්‍රතිපදාව වේ. එබැවින් මුළු ත්‍රිපිටක දහම ම සබ්බ පාපස්ස ගාථාව බව දැනගෙන තෙරුවන් සරණ යාමේ පටන් මුළු බෞද්ධ ප්‍රතිපදාවම සබ්බ පාපස්ස ගාථාව වන බුද්ධ සාසනය බැවින් යමෙක් බුද්ධ සාසනය රකින්න. කටයුතු කරන්නේ නම් කළ යුතු එකම දෙය තම තමන් පව්න් වැළැකී කුසල් කරමින් සිත පිරිසිදු කරගෙන වාසය කිරීමයි.

එවිට තමාගෙන් බුද්ධ ශාසනය රැකේ. බුද්ධ ශාසනයෙන් තමා රැකේ. එසේ නොකර සබ්බ පාපස්ස ගාථාව හත් වර, එකසිය අට වර, දහස් වර, ලක්ෂවර ජප කරමින් තඹ තහඩුවල ලියා ජීවම් කිරීමෙන් බුද්ධ සාසනය නොරැකේ.

සබ්බ පාපස්ස මන්ත්‍රය ජප කරමින් සබ්බ

පාපස්ස යන්ත්‍රය පළඳිනවා යැයි යමක් කියන්නේ නම්, එයින් කියවෙන අර්ථය නම් සියලු පාපයේ යන්ත්‍රය පළඳිනවා යනු යි.

එහෙත් මහා සාගරය, මහා පොලොව මෙන් පැතිරුණු අර්ථයක් ඇති සබ්බ පාපස්ස අකරණ මන්ත්‍රය ඉගෙන සබ්බ පාපස්ස අකරණීය වූ ප්‍රතිපත්තිමය යන්ත්‍රය පළඳින හැටි මේ පුංචි දහම් පොතෙන් පෙන්වා දුනිමි.

එසේ නම් දැන් ඔබ සබ්බ පාපස්ස අකරණ දහම් මන්ත්‍රය ඉගෙන ගෙන සබ්බ පාපස්ස අකරණීය යන්ත්‍රය පළඳින්න. (පිළිපදින්න) එවිට ඔබේ සියලු අභිවෘද්ධිය සිද්ධ වේවි. සියලු දුකින් මිදී උතුම් සැනසීම ද ලැබේ. ඒ සඳහාම ඔබට හොඳ නුවණම පහළ වේවා.

**සාධු ! සාධු !! සාධු !!!**